විවාහ උත්සවයක් සැලසුම් කිරීමේදී මේ දේවල් ගැන හිතන්න..
💚අවම මාස 4කටවත් කලින් වෙඩින් එක ප්ලෑන් කරන්න
💚නැකත හදන කෙනෙක් මුන ගැහිලා අදාල දින,නැකත් ටික ගන්න .
💚නැකත් ගන්නකොට මනමාලි නිවසින් පිට වීම,මනමාලයා නිවසින් පිට වීම,මනමාලියට තැල්ල දැමීම,මනමාලයා හෝල් එකට එම,පොරුව,සහපිටත් වීම,දෙවනි දවසෙ මනමාලයාගෙ ගෙදරට යන නැකත් යන නැකැත් ටික ප්‍රමානවත්.
💚මුලින්ම ඔයාට වෙඩින් එකට වියදම් කරන්න පුලුවන් ගාන බලන්න .ඊට පස්සෙ එ ගානට හරියන්න වැඩ කරන්න .
💚නැකැත් ටික ගත්තු ගමන් සැලොන්,හොටෙල් එක ,ෆොටොග්‍රෆර් හම්බෙලා එයාලව බුක් කරලා ඉන්න.
🤩එක දවසෙ වෙඩින් එකක් ද දවස් දෙකමද...නැත්නම් දෙන්නගෙම සල්ලි එකට දාලද වෙන වෙනමද වියදම් කරන්නෙ...එ ගැනත් හිතලා ඉන්න..
🤩මුලින්ම පොතක ඔනි දේවල් ලිස්ට් එක හදලා ...එ තැන වලට ගිහින් ගනන් මිනුම් දැනගෙන ඔයාගේ අතේ තියන සල්ලි වලට හරියන දේවල් තෝරා ගන්න .
🌹හොටෙල් එක ..
💚මුලින්ම ආරාධනා කරන කට්ටිය ගනන් හදන්න .ඒකට ඔයා ,මනමාලයා දෙවනි මනමාලි මල්කුමරි දෙපැත්තෙම එ සෙට් එක ,මනමාලයා ගෙ ගෙවල් වලින් එන වාහන වල රියදුරන් ,ගොයිනවෙ චේන්ජ් කරනවා නම් සැලෝන් එකෙ අය දිගටම ඉන්නවා නිසා එයාලා ,4ටො ගහන, Dj කට්ටිය එයාලවත් ඇතුලුව ප්ලේට් ගාන හදන්න .
💚හැමෝගෙම ගමන් පහසුවට ලග හොටෙල් එකක් තෝර ගන්නවා නම් සුදුසුයි.දුර එකක් නම් ඔයාලා ගමන් පහසුව සලසනවා නම් හොදයි .
💚ඔයා ගිහින් තියන හොටෙල් එකක් නම් වඩාත් සුදුසුයි.මොකද කෑම ගැන සවිස් එක ගැන දැනුමක් තියන නිසා.
💚හොටෙල් කිහිපයකට ගිහින් ඔයාගේ බජට් එකට සුදුසු හොටෙල් එකක් තෝර ගන්න ..
💚ඔයාගේ ප්ලේට් ගානට සමහර හොටෙල් වලින් ඩෙකරේශන් නොමිලේ ලැබෙනවා.එ ගැනත් අවදානය යොමු කරන්න .ඒක ඔයාට අමතර ලාබයක් .
💚කපල් එක හොටෙල් තෝරන්න ගියත් වෙඩින් එකට සතියකට කලින් වත් දැපැත්තෙම අම්මලා තාත්තා එදාට වගකීම් දෙන සහෝදර හරි යාලුවන් ව හරි ගිහින් අදුන්වලා දෙන්න .මොකද එදාට හොටෙල් සේවකයො අවශ්‍ය දේවල් අහන්නෙ ඔයාගේ ගෙදර අයගෙන් .
💚ඔයාට ඔනි විදිය ගැන හැම විස්තර යක්ම එයාලට කියන්න ..එ වගේම වෙඩින් එකට කලින් දවසෙ පුලුවන් නම් ඩෙකරේශන් බලන්න යන්න
🌹සැලෝන් එක ..
💚කලින් මේකප් කරලා තියන සැලෝන් එකක් තෝර ගන්න .
💚ඔයාට අදින්න ඔනි ඇදුම හෙයා ස්ටයිල් තෝරල පෙන්නන්න..ඒවයින් ඔයාගෙ මූනට ගැලපෙන එකක් එයාලා දායි ..
💚ඔයා අලුතෙන් බඩු ගන්නෙ නැතිව සැලෝන් එකෙන්ම නම් එ දේවල් දෙන්නෙ එ සේරම දේවල් කලින් බලන්න .දාලා ඇදලා බලන්න .
එ දේවල් හරි නැත්නම් ඔයා වෙනම ගන්න .
💚නැත්නන් හෙයා ස්ටයිල් එකයි මේකප් එකයි සැලොන් එකෙන් කර ගන්න ඔයාට වෙනම බඩු ගන්නත් පුලුවන් .
💚හෙයා ස්ටයිල් ,සහ සපත්තු තෝරද්දී මනමාලයා ගෙ උස ගැන සැලකිලිමත් වෙන්න .
💚රිහසල් මේකප් එකක් කරනකොට ටිකක් වෙඩින් එකට සති 2ක් කලින් වගෙ කරන්න .හෙයා ස්ටයිල් දාලා බලන්න

💚ඔයාට ඔයාගේ ගෲප් එකෙ අයට ආසාත්මිකතා තියනවා නම් එ ගැන දැනුවත් කරන්න .
💚වෙඩින් එකට අදින්න සැලොන් එකට යද්දී සේරම ආබරන ගලවලා යන්න .ඔයාගේ ගෲප් එකෙයි.
💚නියපොතු දානවා නම් ඔයාට වැඩක් කර ගන්න පුලුවන් විදියට සාමාන්‍ය ගානට නියපොතු කපලා දාන්න .නේල් ආර්ට් දානකොට මුද්ද දාන අතට මුද්ද දාන්න පුලුවන් විදියට දාන්න .
💚වෙඩින් එකට දින දා ගත් දවසෙ ඉදලා ම හොදට වතුර බොන්න හමෙ වියලි ගතිය අඩු වෙලා මේකප් එක ලස්සන වෙනවා.
💚අදින්න යනකොට එයාලා දෙන වෙලාවට යන්න බලන්න ඔයාගේ පිටත් වෙන නැකත් එක්කලා බලල...ගොඩක් පරක්කු නැකැතක් නම් දෙවනි මනමාලියො හරි කලි යවන්න .
💚සැලෝන් එක ගොඩාක් දුරයි නම් ගෙදර ඉදලා කලින් දවසෙපිටත් වීම් නැකැත් දාගෙන සැලොන් එකට ලග නෑදෑ ගෙදරකො හරි හොටෙල් එකක හරි ඉන්න.
💚සැලොන් එකට වෙලාවට යන්න කියන්නෙ ගිය ගමන් අදින්න පටන් ගන්නෙ නෑ .ඔයාලා මූන හෝදලා ජැකට් එහෙම දාන් එනකොට ටිකක් පරක්කු වෙනව උදේ නිසා පොඩ්ඩක් කම්මැලි නෙ ..එතකොට ඔයාලට 4ටො වලට පරක්කු වෙනව...
💚අනිවාර්‍යයෙන් උදේට කන්න දෙයක් අරන් යන්න ඔයාටයි ගෲප් එකෙ අයටයි..මයිලො වගෙ දෙකුත් අරන් යන්න .
💚පොඩි අය උදේට වමනෙ යන අයද බලලා එවට කරන්න ඕනි දේවල් ලෑස්ති කර ගන්න .
💚මනමාලයගෙ පැත්තෙනුත් උදේට කන්න දෙයක් අරන් යන්න .
🌹ෆොටොග්‍රෆි...
💚ඔයාලා තෝරන පැකේජ් එකේ තියන දේවල් එ විදියට දෙන කෙනෙක්ද කියලා මුලින්ම සැලකිලිමත් වෙන්න .
💚බජට් එකට සුදුසු ..ලස්සනට 4ටො ගහන සහ එඩිට් කරන කෙනෙක් තෝර ගන්න ..
💚මොකද ඔයාගේ වෙඩින් එකෙ මතකසටහන ඇල්බම් එක නිසා ..
🌹වෙඩින් කාඩ්,කේක් බෝක්ස්...
💚සල්ලි තියනවා නම් ඔයාගෙ තීම් එකට ගැලපෙන එකක් තෝර ගන්න .ඔනිම විදියට සාදා ගන්න පුලුවන් ..එක එක ගනන් වලින් තියන නිසා ..
💚ඒත් මං දකින විදියට එ දෙකට ලොකු වියදමක් කරන්න එපා .මොකද එ දෙකම විසික් කරන දේවල් නිසා ..එවට යන වියදමින් වෙන දෙකට යොදවන්න පුලුවන් .
💚වෙඩින් කේක් ඔයාලා කාලා තියන තැනකින් ඔයාට පුලුවන් ගානෙ හැටියට හදවා ගන්න ..
💚කේක් ඔඩර් කරන්න යනකොට වෙඩින් කේක් බොක්ස් එකක් ගෙනියන්න.මොකද සමහර වෙලාවට කේක් එක බොක්ස් එකට දාන්න බැරි වෙලවල් එනවා.
💚උදේට කිරිබත් කපනවා නම් තව කේක් එකක් අවශ්‍ය නෑ..
💚වෙඩින් කේක් නැතිව කප් කේක් එකක් උනත් දෙන්න පුලුවන් .
💚වෙඩින් එකට කලින් දවසෙ කේක් ටික බොක්ස් එකට දාන්න නැත්නම් තෙල් බොක්ස් වල ගෑවෙනවා.
🌹ඩෙකරෙශන් ...
💚ඔයාට සහනදායී පැකේජ් එකක් තොර ගන්න ..
💚ඔයාට තීම් එකක් තියනවා නම් ඒක ගැන පැහැදිලි කරන්න .

💚පෝරුව ,සෙට්බැක් ,පහන,කිරිබත් මේසෙ,කිරිකලය,හෙඩ්ටේබල් ..එ ගැන විශේෂයෙන් සැලකිලිමත් වෙන්න .මොකක්ද වැඩියෙන්ම 4ටො ගහන්නෙ එ තැන් වල නිසා .
💚හොටෙල් එකෙන් එවා පැකේජ් එකට දෙනවා නම් එව ගන්න .
🌹වෙඩින් කාර්..
💚ඔයා තෝර ගත්තු හෝ ඔයාලගෙ වාහනයක් නම් සැරසිලි කරන්න ඔනි විදිය එ කෙනාට පෙන්නලා ඉන්න...
🌹සංගීත කන්ඩායම හෝ Dj එක ..
💚මෙ දවස් වල වැඩියෙන්ම ගන්නෙ නම් Dj තමයි ..කොහොම උනත් ඔයා මීට කලින් අහලා තියන කන්ඩායම ක් තෝර ගන්න ..
🌹වෙස් කන්ඩායම ,ජයමංගල ගාතා,නැටුම්..
💚ගොඩාක් වෙලාවට පෝරුව හරි ඩෙකරේශන් කරන අය ගාවින් මෙයාලව හොයා ගන්න පුලුවන් ..දෙපැත්තෙන්ම අහලා දැරිය හැකි මුදලකට ගන්න පුලුවන් කන්ඩයම ගන්න .නැටුම් කන්ඩායම නම් අවශ්‍ය ම නෑ ඉතින් ...
🤩එදාට වෙන වැඩ පිලිවෙල කොලෙක ලියලා එකට වෙන් කරන වෙලාව දාලා තියා ගන්න එ වෙලාවල් ඇතුලත වැඩ ටික කරන්න බලන්න ..
නැත්නම් ගොයිනවෙ චේන්ජ් කරනවා නම් එහෙම ඔයාලට වෙලාව මදි වෙයි..
🤩ඔයාලට හොටෙල් එක බුක් කරාම එයාලා එක්කලා සම්බන්ද වෙලා තියන ඩෙකරේශන් ,කැමරා අයව අඩු ගානට ලබා ගන්නත් පුලුවන් .
🤩ඔයා හනිමූන් යනකොට ගෙනියන බඩු සෙට් එක කොලේක ලියලා තියාගන්න .පොඩි දේ උනත් එ වෙලේට අමතක වෙන නිසා .
විශේෂයෙන් ගැස්ට්‍රයිටිස් ,ඔලුවෙ කැක්කුම්,බඩ රිදීම්,වගෙ ඒවා නිතර එන කෙනෙක් නම් ඒවට හරියන බෙහෙත් දා ගන්න .
4න් චාජර්,පවර්බැන්ක්,මතක ඇතිව ගෙනියන්න.
🤩මනමාලයා ගෙ ගෙදර ගෙනියන බඩු සෙට් එක සති දෙකකට කලින් ඉදලා වගෙ පැක් කරන්න ගන්න.
🤩වෙඩින් එකට අව්ශ්‍ය පෝරු,සහ අනිකුත් දේවල් සතියකට කලින් වත් අරන් තියා ගන්න .කල්තබා ගන්න බැරි දේවල් විතරක් කලින් දවසෙ ගන්න .
🤩හොටෙල් එකට ගෙනියන බඩු ලිස්ට් එකක් හදලා එවා ගානට මතක් කරලා ගෙනියන්න .කලින් දවසෙ රෑ හෝල් එකට හම්බෙන රූම් එකෙන් ගිහින් තිබ්බත් කමක් නෑ .
🤩එදාට එ සේරම වගකීම් ගන්න පුලුවන් අයට බාර දීලා තියන්න..වෙන්න ඔනි විදිය පැහැදිලි කරලා ..එතකොට ලේසියි ..
🤩ඔයා ලබාගත් සේවයට එයාලගෙ මුදල් ඇඩ්වාන්ස් කලින් දීලා නෙ..ඉතුරු මුදල් ලියුම් කවර වල දාලා නම් ලියලා අම්මගෙ හො ඒවා බාර දෙන කෙනාට දීලා එවා ගානට ගෙවීම් කරන්න කියන්න ..
🤩අනිත් එක තමයි අපි වෙඩින් එකකට නෑදෑයොන්ට යාලුවන්ට ආරාධනා කරන්නෙ සතුටට කන්න දෙන්න.එ නිසා එයාලා ගාවට ගිහින් මනමාලි ,මනමාලයා ගෙ අම්මලට එයාලා එක්කලා පොඩ්ඩක් කතා බහ කරන්න කියන්න ..
💚වෙඩින් එකට දවස් 2කට කලින් හො කලින් දවසෙ දෙන්නගෙම ගෙවල් වලට හාමුදුරුවො වැඩම්මලා පිරිත් කියලා පිරිත් නූල් ගැට ගහන්න...එන හාමුදුරු නමක් ඇති..නැත්නම් පංසලට ගිහින් ඒක කරන්න..
💚නිතරම කාඩ් දාන්න බැරි නිසා එක පාර රු 1000ක් වත් 4න් එකට දාලා තියන්න.
💚ඔයාගෙ 4න් එක හොටෙල් එකට කොයි පැත්තෙන් ආවත් පාර කියන්න් දන්න කෙනෙක්ගෙ නු එක දුර ඉදලා එන අයට දීලා එ කෙනාව දැනුවත් කරලා තියන්න.

💚තැල්ල තියන වෙලාවට පැය බාගෙකට කලින් එලාම් එකක් තියන්න.ආයි විනාඩි 4කට කලින් එලම් එකක් තියබ්න අමතක උනොත් කියලා...
💚අනිත් එක මනමාලි මනමාලයගෙ අම්මලාට පහසු විදියට සාරිය ඔසරිය අදින්න දෙන්න..සපත්තුත් එ වගෙ..මොකද් එ දෙන්න දවසම හිටගෙන,මුලු හෝල් එකේම ඇවිදින්න ඔනි..පව්නෙ එයාලා..
💚අලුත් සපත්තු දානකොට කකුල් කැපෙන නිසා කැපෙන තැන් වලට ප්ලාස්ටර් ගහන්න.මනමාලි ගෲප් එක,අම්මලාට එහෙම..හැමෝටම එහෙම වෙන්නෙ නෑ..
💚වෙඩින් එකට කලින් දවසෙ කිසිම වැඩක් දා ගන්න එපා .මොනම හරි දෙයක් තිබ්බොත් කලින් දවසෙ දවල් 12කලින් ඉවර කර ගන්න බලන්න..හරියටම ප්ලෑන් කරොත් එක කරන්න පුලුවන්..
💚මං එහෙම කිව්වෙ මහන්සි වැඩි නිසා..මොකද් ගොඩාක් මනමාලියො වෙඩින් එක දවසෙ 4ටො වලට,අඳුරන අය දැක්කම ඇරෙන්න හිනා වෙනව අඩුයි කල්පනාකර කර වගෙ ඉන්නෙ..ඇගෙ තියන මහන්සි ගතිය,නිදිමත නිසා තමයි එ..
💚බඩගින්නෙ ඉන්න නම් එපා බයිට් පොඩ්ඩක් හරි කන්න..
💚සමහර හොටෙල් වල වැඩිවෙන ප්ලේට් ගානට,කැඩෙන දේවල් වලට,තව බීපු අය කබරයාදාලා🙈 කාපට් සවුත්තු උනාම එවා කපා ගන්න වැඩිපුර සල්ලි 30000ක් වගෙ තියා ගන්නව..එකෙ බැලන්ස් එක බලන්න කෙනෙක් දාන්න(සිහියෙන් ඉන්න කෙනෙක්)
💚වෙඩින් එකට දවස් 15කට කලින්වත් රෙජිස්ටර් වෙලා ඉන්නවා නම් ඔයාලට ලේසියි.
💚මනමාලි නියපොතු දානවා නම් එදාට රෙජිස්ටර් වෙනවා නම් අස්සන් කරන්න පෑන අල්ලන්න පුලුවන් ගානට නියපොතු දාන්න😬
🤗🤗ඔයාලා අහපු එවට උත්තර..
🌹වන් ඩෙ වෙඩින් එකක් ගන්නකොට..
💚පෝරුව වෙලාව 8.45 ඉදලා දා ගන්න බලන්න. පිටත් වෙන වෙලාව 4න් පස්සෙ දා ගන්න් බලන්න..නැත්නම් රෑදෙන වෙලාව මදිනෙ..
💚එදාම රතුපාට ඇදුම අදිනවා නම් විතරයි මේව අදාල.කැන්ඩියන් එක පිටින් ඉන්න අයට වෙන වෙඩින් වගෙ තමයි..
💚සැලොන් එකෙ කෙනාව දැනුවත් කරන්න
💚ෆොටොග්‍රැෆර් දැනුවත් කරන්න.සමහර අය ගාව එවට පැකේජ් තියනව.
💚ඔයාලා දෙන්නගෙම ලිස්ට් වල එකම කෙනා ඉන්නවාද බලලා ලිස්ට් එක ක්ලියර් කරලා ගාන හදා ගන්න.
💚ඔයාලගෙ ගාන බලලා සුදුසු හොටෙල් එකක් තෝර ගන්න..පිරිස වැඩි නිසා...
💚වෙඩින් කාර එක උදේට එනකොට සුදු මල් දාලා, හවසට රතු පාට මල් දාන්න කාර් එකෙ කෙනාට බාර දෙන්න.
💚ඔයාලගෙ සෙට්බැක් එකෙ උදේට සුදුපාටින් දාලා හවසට රතු පාටින් මල් ටිකක් සෙට් කරල දෙන්න පුලුවන්ද කියලා අහලා බලන්න.(මේක කරන්නම ඔනි නෑ)
💚නැත්නම් දෙකටම ගැලපෙන ඩෙකරේශන් ගන්න..
💚හොටෙල් එකෙ ලයිට් උදේට චාම් පාටකිනුත් ඔයා චේන්ජ් කරලා එනකොට වෙන පාටකිනුත් දාන්න කියන්න..එක ගොයිනවෙ චේන්ජ් කරන අයටත් කරන්න පුලුවන් දෙයක්.
💚උදේට කැන්ඩියන් එක,මනමාලයා තුප්පොට්ටිය හො නැශනල් එක.
💚පෝරුව චාරිත්‍ර.
💚මිල්ක් ෆවුන්ටන්.
💚කිරිබත් මේසේ.

💚නැදෑයො එක්කලා 4ටෝ ගහන්න.(ටේබල් එකෙන් ටේබල් එකට ගිහින් හරි නැදෑයො හෝල් එකට ආපු ගමන් හරි ඒක කරන්න
💚එ අතරෙ වෙල්කම් ඩ්‍රින්ක් බයිට් ඔයාලා දෙන දෙ දෙන්න..
💚හරියටම 12ට බුෆෙ එකට යන්න...
💚12.35 වගෙ වෙනකොට චේන්ජ් කරන්න යන්න ඔයා දෙවනි දවසට අදින ඇදුම..
💚හොටෙල් එකෙ 4ටෝ ශූට් එක කරන්න (තැන්ක් යු කාඩ් එකට එ 4ටෝ දෙකම ඇඩ්කරන්න පුලුවන්.නැත්නම් තැන්ක් යු කාඩ්2ම දෙන්න පුලුවන්.එක ඔයාගෙ කැමැත්ත)
💚හෝල් එකට එන්න..
💚කේක් එක කපන්න
💚ශැම්පේන් ෆවුන්ටන් එක.
💚කට්ටිය එක්කලා 4ටෝ ගහන්න.
💚අයිස් කොෆි එක දෙන්න.
💚ඔයාට චේන්ජ් කරන්න කී දෙනෙක් එනවද බලන්න..ඩෙකරේශන් අය,කාර් එකෙ කෙනා දිගටම ඉන්නවද බලන්න.එයාලට වෙල්කම් ඩ්‍රින්ක් හරි,කෑම හරි දෙන්න..(මොකද අපෙ වෙඩින් එකට උදව් වෙන එන අයව කන්න නොදී යවන එක හරි නැති නිසා.හැබැයි ඒක ඔයාගෙ කැමැත්ත)
💚හනිමූන් සදහා පිටත් වීම්.
💚මනමාලයගෙ ගෙදර යන්න නැකතක් දාන් එදාට ඔයාගෙ පවුලෙ අය එක්කලා යන්න.(නැදෑයො නම් අවශ්‍ය නෑ.)නොමල් සාරි එකක්,ඔසරියක් අදින්න.එදාට පොඩි තේ මේසයක්,වෙල්කම් ඩ්‍රින්ක් එක හෝ සාමාන්‍ය කෑම වේලක් හො දෙකම තිබුනම ඇති..
💚පලවෙනි දවසෙ චේන්ජ් නොකර කැන්ඩියන් හිටිය අය මනමාලයාගෙ ගෙදර යනකොට ,
💚මනමාලයා දෙන සාරි එක ඇදන් යන්න පුලුවන්.
💚ෆොටෝ ශූට් එක.කැමරාමන් උදේ 4ටෝ ශූට් එක කරනව.
💚කේක් කපන්න
💚පොල්තෙල් පහන
💚වෙල්කම් ඩ්‍රින්ක් එක
💚බුෆෙ එක..
කැමති දෙයක් තොරන් කරන්න..වියදම් අඩු විදියට.
ඉතුරු ටික අනිත්වයි විදියමයි..ඇල්බම් එකට ඔනි නිසා අනිවාර්යෙන් 4ටෝ ටික ඔනිමයි.
🌹🌹ගෙදර වෙඩින් එක ගන්නකොට.
💚ගොඩාක් වගකීම් තියන වැඩක්..වෙන්න ඔනි විදිය කලින් ප්ලෑන් කරලා එ විදියට් කරන්න් අයට බාර දෙන්න.
💚ඔයාලා කලින් ගෙ අස් කරලා ඉඩ ගන්න.අනවශ්‍ය සේරම දේවල් කබඩ් වලට දාලා වහන්න.කුස්සියත් එහෙමයි..
💚කුස්සියෙ අස් කරලා ඉඩ අනිවාර්යෙන් තියෙන්න ඔනි.
💚ෆ්‍රිජ් එකත් අනිවාර්යෙන් අස් කරලා තියන්න.අයිස්,ඩෙසර්ට්,බීම වගෙ දේවල් දාන්න ඔනි නිසා.
💚මිදුලත් අස් කරලා ඉඩගන්න..කාලෙක ඉදලා කරන් එනකොට ලොකු මහන්සියක් වෙන් නෑ..
💚ගෙදර පාට ගාන එවා සතියකට කලින් වත් කරන්න.සෝදලා අස් කරනවා නම් එකත් එහෙමයි.
💚අලුතින් කුර්ටන් දානවා නම් එකත් සතියකට කලින්වත් කරන්න..

💚පොරුවෙ බඩු,උයන බඩු ,ඩෙසර්ට් එකට ඔනි දේවල් ගේනවා නම් කල් තියා ගන්න පුලුවන් එවා ලිස්ට් එක ලියලා එවත් සතියකට කලින් ගෙනත් තියා ගන්න.
💚නරක් වෙන දේවල් කලින් දවසෙ ගිහින් ගේන්න බාර දෙන්න.
එලවලු,පලතුරු,මස්,මාලු වගෙ දේ...
💚වෙඩින් කේක් ටික කලින් දවසෙ උදේ බොක්ස් වලට දාන්න,කැවිලි හදනවා නම් වෙඩින් එකට දවිස් 2කලින් සේරම ඉවර කරන්න...
💚වෙඩින් එකට කලින් දවසෙ ලොකු වැඩ තියා ගන්න් එපා.මොකද ගෙදර අයට මහන්සි නිසා.
💚ඩෙකරේශන් කරන අයට ගොඩක් රෑ වෙන්නෙ නැතිව ඉක්මන්ට ඇවිත් එ වැඩෙ කරලා දෙන්න කියන්න.
💚එක තැනක් අස් කරලා කැවිලි,අවශ්‍ය බඩු තියලා තියන්න.එවා හැමොඉටම දැනුම් දීලා තියන්න.එතකොට පිලිවෙලයි.
💚කලින් දවසෙ ගෙදර අය අදින ඇදුම්,සපත්තු සේරම අයන් කරලා හැගඅස්වල දාලා එක තැනක තියන්න.
💚ඔයා ගෙනියන බඩු බෑග් එක දවිස් 4කට කලින්වත් ලැස්ති කරලා තියන්න.
💚පොල්තෙල් පහන,කේක් ටේබල් එක හැදුවට පස්සෙ ගිනිපෙට්ටි,ඉටිපන්දම්,පිහිය කලින්ම එතනින් තියලා තියන්න.අදින්න පොඩිඅය නැත්නම්.
💚පොරුවෙ බඩු ටික එතනින් තියලා තියන්න.
💚වෙඩින් එකට කලින් දවසෙ නරක් වෙන බඩු ගේන එක,පිගන් වගෙ දේවල් සොදන එක,ඩෙසර්ට් හදන එක,ඩෙකරෙශන් ඇරෙන්න වෙන කිසිම වැඩක් තියා ගන්න එපා..එතකොට ලේසියි.
💚හට් එක කලින් දවසෙ උදෙන්ම ඇවිත් ගහන්න කියන්න.
💚එතකොට ටේබල්,පුටු,ෆෑන් තියන්න ඔනි විදිය හිතා ගන්න පුලුවන්.
💚ගෙදර අය නම් කිරිබත් හදන්නෙ කලින් දවසෙ සේරම දේවල් ලැස්ති කරලා තියන්න..
(ලූනු සුද්ද කරලා වගෙ දේවල්,)
💚වැඩ ඉවර අයට් පැයක් වත් නිදා ගන්න කියන්න..සේරම වැඩ හරියට ආවොත් ටිකක් මහන්සි ඇරෙන්න එක තැනක ඉන්න පුලුවන්.
ඇහැරිලා හිටියත් එලාම් තියන්න..
💚මනමාලයගෙ කකුල හොදන බේසම කෝප්පෙ හවසම එලියෙන් තියලා තියන්න.
💚වැඩට එන අයට තෙ දෙන එක එක්කෙනෙක්ට බාර දීලා තියන්න.
💚ඔයා සැලොන් එකට යනවා නම් එයාලා කියපු වෙලාවටම යන්න..
🤩හට් එක සහ ඩෙකරේශන්..
💚මුලින්ම හට් කියක් ගහන්න පුලුවන්ද.බලන්න.අනිවාර්‍යයෙන් බුෆෙ එකට හට් එකක් ඔනිමයි.
💚හට් එක ඇතුලෙ හොටෙල්වල වගෙ ටේබල් දාන්න පුලුවන්.හැබැයි එන පිරිස මත තමයි ඒක තිරනය වෙන්නේ .එහෙම කරොත් ලස්සනයි ඉතින්.
💚Dj ගහනවා නම් එකට තැනක් ලැස්ති කරන්න.
💚කේටරින් කරන අය ගාව ලොකු ෆෑන් තියනව.එවාත් ගන්න .
💚සෙටිබැක්,පහන,කේක්,කිරිබත්,මිල්ක් ෆවුන්ටන්,පෝරුව,හෙඩ් ටේබල් එක ගෙ ඇතුලට ගන්න.
💚සෙටිබැක් එක ෆොටොග්‍රෆර්ට 4ටො ගහන්න පරතරය තියන තැනක් ගන්න.
ඉඩ මදි නම් එකක් ඉවර වෙනකොට එක ලග තියන්න පුලුවන්නෙ..වැඩියෙන්ම ඔනි සෙටිබැක් එකනෙ.
💚සරල ඩෙකරේශන් තෝර ගන්න..

💚එන අයට ගෙ ඇතුලෙ ඉන්න ඉඩ තියන්න එපා...ඒක අපහසුවක්..
🤩වැඩ බාර දීම..
💚වෙල්කම් ඩ්‍රින්ක් එකෙ ගෙදරනෙ හදන්නෙ.එවා කලින් හදලා අසුරලා තියන්න.සහ වෙලාවට බෙදන්න .
💚එන අයට දෙන්න ඕනි බයිට් එහෙම බාර දෙන්න.වෙල්කම් ඩ්‍රින්ක් එකෙන් පස්සෙ එවා දෙන්න කියන්න..
💚වෙඩින් කේක් තව කෙනෙක්ට බාර දෙන්න.
💚කැවිලි මේසේ,බුෆෙ එක ,පෝරුවෙ වැඩ..එකින් එකට බෙදලා තියන්න...
💚පුටුවලට ටේබල් වලට කවර් දාන වැඩෙ උදෙන්ම කරන්න කෙනෙක්ට බාර දෙන්න එයාලා කරලා දෙන්නෙ නැත්නම්.
💚වැඩ කරන්න ගෙදර අය,නෑදෑයො,යාලුවො ඉන්නවා නම් අවුලක් නැනේ..
💚නැත්නම් කේටරින් එකෙ අය ගාව වැඩ කරන අය ඉන්නව.
💚හොටෙල් ස්කූල් වලින් කට්ටිය ගන්න පුලුවන්.
💚කරන්න ඕනි විදිය එයාලට කියලා තියන්න..
🤩කේටරින් එක සහ කෑම..
💚කෙටරින් එකෙන් සෙරම දේවල් ගන්න පුලුවන්නෙ..එයාලට කියන්න ඔයාට ඕනි විදිය..
💚මෙතනදි ඔයාට ඕනි මෙනු එක දාන්න පුලුවන්..රයිස් වර්ග කියද,නූඩ්ලස් තියනවද,ප්‍රධාන කරි වර්ග,අනිත් කරි,සලාද...
💚එයාලගෙ මෙනු එකට ඔයාට ඕනි සේරම එනකොට ගන වැඩියි නම් ඔයාට පුලුවන් එවා ගෙදර හදන්න පුලුවන් ඔයාගෙ ගානට ශේප් වෙන විදියට.
💚ඩෙසර්ට් එහෙමනම් අමාරු එවා නැතුව අනිත් එවා ඔයාලට හදන්න පුලුවන්නෙ..
💚ඔයාට ගෙදරත් හොටෙල් එක වගෙ ලස්සනට කරන්න පුලුවන්..ටේබල්වල වතුර විදුරු එහෙම තියලා.බුෆෙ එකෙ වෙලාවට එ විදුරු වලට වතුර දාලා ,බයිට් කන්න පොඩි දීසි එහෙම තියලා.
💚පොඩි පොඩි වැඩ පස්සෙ කරනව කියලා දා ගන්න එපා.සේරම එකතු උනාම පිස්සු වගෙ වෙනව.කලින් දවසෙ පුලුවන් තරම් ෆ්‍රී කර ගන්න බලන්න..
💚මුල ඉදලා වැඩපිලිවෙලට ලියලා කරලා ඉවර උනාම හරියක්දාලා තියන්න.
🌹හනිමූන් ගෙනියන බැග් එක ගැන අහලා තිබුනා.එත් වෙන කෙනෙක්ගෙ පෝස්ට් එකකට උත්තර දීලා තිබුනා කට්ටිය..එ නිසා එ ගැන ලියන් නෑ...2යි ලියන්නෙ.
💚කතුරක් අරන් යන්න දැන් මනමාලිගෙ මාල ටික,අලුතින් දාන ඔනමින්ට් මහනවා.එවා කපන්න ඕනි උනොත් එහෙම.
💚නූලක්,ඉදිකට්ටක් ,හැට්ටකටු-අදින එකක බොත්තමක්වත් ගැලඋනොත් එහෙම දන්නවනෙ නිකම් දවස් වලටත් වෙන දේවල් ඉතින්..
💐හොටෙල් එකකට ගිහින් කතා කරන්න ඕනි දේවල්..
💚මුලින්ම අපෙ වෙඩින් එකට ආරාදනා කරන අයගෙ ලිස්ට් එක හදා ගන්න ඕනි..කී දෙනෙක්ද කියලා ..100-150-200එ වගෙ..
💚හොටෙල් එකෙ එ පිරිස දාන්න පුලුවන්ද කියන එක මුලින්ම බලන්න.(.පෝරුව,සෙටිබැක් එක ආවම ඉඩ කොහ්මද බලන්න..)
💚හෝල් එක දෙන කාලය බලන්න..සමහර එවයි එයාලා දෙන කාලය ඉවර උනාම වැඩිපුර ගෙවන්න වෙනවා.එ නිසා ඔයාලට පිටවීම් නැකැත්,ඇතුල්වීම් නැකැත් වෙලාවල් කියන්න.
💚එයාලගෙ පැකේජ් බලන්න..එවයින් සුදුසු එකක් තෝරගෙන එවයි විසතර..

🌵පෝරුව, සෙට්බැක්,ඩෙකරේශන්,කේක් කපන්න,කිරිබත් කපන්න පිහි,කකුල හෝදන බාජන ,වෙඩින් කාර් එයාලා දෙනවද අහන්න..දෙනවා නම් එවයි විස්තර ගන්න.
🌵පෝරුව එලියෙ ගන්නවා නම් එ ගැන..
🌵බ්‍රයිඩ්ට දෙන රූම් එකට අමතරව ජයමංගල ගාතා,බෙර ,නැටුම් එවාට වෙනම රූම් එකක් ගන්න පුලුවන්ද..
🌵උදේට කැවිලි මේසේ කැවිලි දාන්න බාජන එයාලා දෙනවද,උදේට දෙන තේ එක එයාලා දෙනවද,අපේ බඩු වලට එයාලා හදලා දෙනවද අහන්න.
🌵වෙල්කම් එක කොහොමද වෙන්නෙ- කිරිබත් හොටෙල් එකෙන් ගන්නවා නම් එයාලට කපන කිරිබත් එක හදලා දෙනවද,එක ඩෙකරේශන් අය එක්කලත් කතා කරලා බලන්න.
🌵වෙල්කම් ඩ්‍රින්ක් එකට දෙන්නෙ මොනාද ,එක දෙන්නෙ කොහොමද (ටේබල් එකෙ තියලා තියනවද,අමුත්තා ආවම දෙනවද)කිසිම කෙනෙක්ව මග ඇරෙන් නැති වෙන්න දෙන්න කියන්න.
🌵වෙල්කම් එකයි,බුෆෙ එකයි අතර කාලයට දෙන බයිට් එක ගැන..(අවශ්‍ය ප්‍රමාන..එයාලා දන්නවා සාමන්‍යෙන් දෙන විදිය.ඊට අමතර වැඩි දෙයක් ඔනි නම් එ ගැන.
🌵බාර් එකෙ වැඩ ටික ගැන-එකෙ බයිට් වර්ග ගැන..
🌵කෑම-ප්ලේට් එකෙ ගාන,එකට එන කරි වර්ග,ඩෙසර්ට් එක.
🌵හවසට දෙන අයිස් කොෆි එක ගැන..
🌵ලයිට් සිස්ටම් එක ගැන.
🌵පුල් එකක් තියන හොටෙල් එකක් නම් එක ගන්න පුලුවන්ද..
🌵හොටෙල් එකෙම ඉන්නවා නම් හනිමූන් රූම් එක ගැන..කෑම ගැන..එ පැකේජ් එක ගැන.
🌵බ්‍රයිඩ් අඳින්නෙ එ හොටෙල් එකෙනම් සැලෝන් එකක් තියනවද නැද්ද..නැත්නම් ඩ්‍රෙසින් රූම් එකට ඔනි ලයිට් තියනවද බලන්න..නැත්නම් දාලා දෙන්න කියන්න..
🌵පුටු කවර ,කර්ටන් ,වල පාට වෙනස් කරන්න පුලුවන්ද(ඔයාට අවශ්‍ය පාටට)සමහර අය එක කරලා දෙනවා.
🌵ගොයිනවෙ චේන්ජ් කරනවා නම් ,ඒකට කේක් ,ශැම්පේන් එහෙම තියනවා නම් එ ගැන..ඔයාට ඔනි විදිය කියන්න් එ විදියට හදල තියන්න කියන්න.
🌵4ටො ගහන්න ලොකේශන් තියනවද.
එ දේවල් තමයි....
💐තව හනිමූන් ගෙනියන බැග් එක ගැන දාන්න කියලා කියලා තිබුනා..එක ගැන පෝස්ට් එකක් වෙන සොයුරියක් දාලා තිබුනා..මගෙනුත් දෙතුන් දෙනෙක්ම ආපහු අහපු නිස මාත් දන්නම්..
🌵දෙන්නගෙ බඩු වෙන වෙනම පැක් කරනවා නම් ලේසියි..
🌵හෝම්කමින්ග් අඳින ඇදුම අව්ශ්‍ය නම් විතරක් ගෙනියන්න..නැත්නම් ඇදුම සෙට් කරලා වෙන කෙනෙක්ට බාර දෙන්න හොක්ම්කමින්ග් එක දවසෙ සැලෝන් එකට ගෙනත් දෙන්න කියලා.
🌵යන පලාත කොයි වගෙද කියලා බලලා ඇදුම්,බඩු ලෑස්ති කරන්න.
🌵ඩේ,නයිට් කියක්ද් බලලා ඇදුම් ගන්න.
🌵බීච් එක හරි,පූල් එක,දිය ඇල්ලක් හරි තියන තැනක්,පලාතක් නම් එකටහරියන ඇදුම්.
🌵ඇවිදින්න යනවාඇදුම් වලට අවශ්‍ය ජුවලරි, පොඩි මේකප් බඩු ටිකක්.
🌵සපත්තු,සෙරෙප්පු 2ක්

🌵මේකප් රිමු එකක් අවශ්‍ය නම් විතරක්,ෆේශ්වොශ්,ශැම්පු,කන්ඩිශනර්,බොඩිවොශ්,ටූත්පේස්,බ්‍රශ්
🌵ටවල්,ටිශු,සනීපාරක්ශක ද්‍රව්‍ය.
🌵ඩියොට්‍රන් ,බොඩි ක්‍රීම් එක,සන් ක්‍රීම් එක.ඔඩිකොලොන් එක.පනාව,බූල්බැන්ඩ්,කොන්ඩ කටු,සිලිකන් ඔයිල්.
🌵ඔයාලා කලින් ඉදලම ගන්න බෙහෙත් වර්ග තියනවන්ම්,ප්ලාස්ටර්,පැනඩෝල්,සිද්දාලේප,පිරිටන්2ක්.
🌵4න්4න් චාජර්,පවර් බෑන්ක්,4න් කාඩ්,සල්ලි ගන්න කාඩ්,අවශ්‍ය මුදල්. එවා දාලා තියන්න පොඩි සයිඩ් බෑග් එකක්.
🌵හොම්කමින්ග් එකට ගාන කියුටෙක්ස්,රිමු එකක්.
🌵නූල්,ඉදිකටු,කතුර,කටු කැරැල්ලක්.
🌵නෙත ඇදුම්,දාන්න ඉටි කවර,ශොපින් බෑග් .
🌵වතුර බෝතලයක්,කන්න බිස්කට් ස්නැක් මොනා හරි ටිකක්.
අඩුමොනා හරි තියනවා නම් ඔයාලා කමෙන්ට් කරන්න.
🦋ලමායි..මේක නම් වැදගත්..බජට් එක බැලන්ස් කරන එක වෙඩින් එකට විතරක් නෙමෙයි හැමදේටම වැදගත්...
👇මං මෙ දාන එකෙන් ඔයාලගෙ බජට් එක බැලන්ස් කර ගන්න පුලුවන් වෙයි..
🤩අවශ්‍යම දේ....
🐳මාලය,මුදු දෙක රු ...........
🐳මල්ලිට දෙන මුද්ද රු ............
එකතුව = රු .............
🐳වෙඩින් කාඩ් රු ...............
🐳කේක් බොක්ස් රු .............
🐳වෙඩින් කේක්(කැලි කියකක්ද) රු ............
🐳වෙඩින් කාර්,ඩෙකරේශන් රු ...........
🐳අමතර රු .............
එකතුව =රු :-............
🌷හොටෙල් එක🌷
🤩කෑම.....
🐳කැවිලි(වෙන වෙනම ගනන් දාන්න) රු ........
🐳කිරිබත් රු ............
🐳ප්ලේට් එකට රු .............
🐳බාර් එකට බෝතල් රු ...............
🐳බාර් එකෙ බයිට් එකට රු ...........
🐳බයිට් එන අයට දෙන රු..............
🐳තේ රු ...............
🐳අයිස් කොෆී රු .................
🐳අමතර රු ................
එකතුව = රු :-...............
🤩හෝල් එක..
🐳ඩෙකරේශන් (පෝරුව,සෙටිබැක්,ඔයිල් ලැම්ප්,ටේබල් ඩෙකරේශන්,මිල්ක් ෆවුන්ටන්-මෙවයි ගනන් වෙන වෙනම නම් එවා ලියන්න)
🐳පෝරුව චාරිත්‍ර
🐳ජයමංගල ගාතා

🐳කේක් හො කිරිබත්
🐳බෙර කන්ඩායම
🐳ඩාන්සින් ගෲප්
🐳බෑන්ඩ් හෝ Dj
🐳අමතර
එකතුව... = රු :-.............
🌷මනමාලි🌷
🤩ඇදුම්..
🐳වෙඩින් සාරි
🐳ජුවලරි
🐳සපත්තු
🐳මේකප්,හෙයා ස්ටයිල්
🐳මල් බොකේ
🐳දෙවනි මනමාලි ඇදුම්
🐳ජුවලරි
🐳සපත්තු
🐳මල්
🐳මේකප්,හෙයා ස්ටයිල්
🐳මල්කුමාරි ඇදුම්
🐳ජුවලරි
🐳සපත්තු
🐳මල්
🐳මේකප් ,හෙයා ස්ටයිල්
🐳ගොයිනවෙ ඇදුම
🐳සපත්තු
🐳ජුවලරි
🐳මල්
🐳මේකප්,හෙයා ස්ටයිල්
🐳හෝම්කමින්ග් ඇදුම
🐳සපත්තු
🐳ජුවලරි
🐳මල්
🐳මේකප් ,හෙයා ස්ටයිල්
🐳අමතර
එකතුව =රු :- ...............
මනමාලයගෙ එවත් දාන්න පුලුවන්.
🌷ෆොටොග්‍රැපි,විඩියො🌷
🐳ෆොටොවලට ගාන
🐳විඩියො වලට ගාන
🐳ප්‍රී ශූට්
🐳තැන්ක් යු කාඩ්
🐳ඇල්බම්
🐳ෆොටො ෆ්‍රේම්
🐳අමතර
එකතුව = රු :- ..................

🌷හනිමූන්🌷
🐳හොටෙල්
🐳කෑම
🐳ට්‍රැවල්(යන්න එන්න වියදම)
🐳අමතර මුදල්
🐳අනෙකුත්
එකතුව = රු :- ............
වෙනත් අමතර දේ = රු :- ...........
මුලු එකතුව = රු :- ............
වෙඩින් එකට වෙන් කල සම්පූර්න මුදල
= රු :- ...............
ඉතිරිය හො මදි උ මුදල = රු :- ............
🐛වෙඩින් එකට වෙන් කල මුදලින් මුලුඑකතුව අඩු කරලා ඉතුරු වෙනවා නම් හොදයි. වෙන් කරපු මුදලට වැඩිය වැඩි වෙනවා නම් අනවශ්‍ය වියදම් කපා හරින්න..
💚අමතර කියල දාලා තියන එවට කෑම,එ තැන් වලට ගිය ට්‍රැවලින් ගාස්තු දාන්න පුලුවන්.
💚හෝම්කමින්ග් එකෙ සහ මනමාලයගෙ ගනනුත් දා ගන්න.ලියන්න කම්මැලි නිසා දැම්මෙ නෑ😏😁🙈
🦋මෙක වෙඩින් ඩේ එකෙ පිලිවෙල..
මේක පිලිවෙලකට වැඩ කරන කෙනෙක්ට දීලා එයාට් වැඩ බලන්න කියන්න..
දිනය.2020.00.00
🐙06.00 am - 4ටො ශූට් එකට යෑම
🐙8.00 am- වෙඩින් හෝල් එක සූදානම් විය යුතුයි(මනමාලි එන්න පැය බාගෙකට කලින්)
🐙8.30 am- මනමාලි පැමිනිම.
🐙00.00am -මනමාලය පැමිනිම.
🐙00.00am - පෝරුව පටන් ගැනිම
🐙00.00am - පෝරුව ඉවර කිරිම
🐙00.00am- පොල්තෙල් පහන,කිරිබත් කැපීම
🐙00.00 am - උදේම ආපු අය එක්කලා 4ටො ගැනිම.
🐙00.00 am - පැමිනි අයට කතා කරන්න යෑම
එ අතර ප්‍රී ශූට් එක දැමීම.
🐙00.00 am- අනිකුත් අය එක්කලා 4ටො ගැනීම
🐙12.05 pm - බුෆෙ ඔපන්
🐙00.00 Pm - ගොයිනවෙචේන්ජ් කරන්න් යෑම්(පැය බාගයි)
🐙00.00pm - ගොයිනවෙ 4ටො ශූට් විනාඩි 20
🐙00.00 pm - වෙල්කම් සෝන්ග් නැවත හොල් එකට එනකොට
🐙00.00 pm- කේක් කැපීම,ශැම්පේන් ෆවුන්ටන්
🐙00.00 Pm - ඩාන්සින් ෆ්ලෝ ඔපන් ,ගොයිනවෙ එකෙන් 4ටො ගැසිම.
🐙00.00 pm -ඩාන්සින් ෆ්ලෝ එක ක්ලෝස් කිරිම
🐙00.00 pm - කතාව(විනාඩි 😎
🐙00.00 pm - කතාව (විනාඩි 😎
🐙00.00pm -පිටත් වීම්.
ඔයාලා ආපු අයට දෙන ස්ප්‍රයිස් ඩාන්ස් තියනවා නම් එ වෙලාවල් ඇඩ් කර ගන්න.
🦋හෝම් කමින්ග්

🌸00.00 - 4ටො ශූට් එකට යෑම
🌸00.00 - පැය බාගෙකට කලින් ගේදර ලගට ගිහින් ඉන්න.රැග් එක දුන්නොත් එහෙම වෙලාව පහු වෙයි😉
🌸00.00 - ගෙදරට ඇතුලු විම්
🌸00.00 - පොල්තෙල් පහන,කේක් කැපිම
🌸00.00 - 4ටො ගැනීම
🌸00.00 - පැමිනි අය එක්කලා කතා කිරිම.
🌸00.00 - බුෆෙ එක ඔපන් කිරිම
🌸00.00 - කැමති වෙලාවකට ඉවර කර ගන්න පුලුවන් ගෙදර නම්..
ඔයාලගෙ නැකැත් අනුව වෙලාවල් දා ගන්න..
🐛කොච්චර කැවත් මහත් වෙන් නැති කෙට්ටු කෙල්ලො බය වෙන්න එපා කිඩ්ස් එකෙ ඇදුම්,ට්‍රවුසර් අදින අයත් මනමාලි උනාම ලස්සනයි..සැලොන් එකෙන් ඇදුමෙ පාට ගලපලා ,ගැජට් කැලි දාලා මහත් කරලා ගන්නවා හොදේ😉
🐛මහත කෙල්ලො නම් පොඩ්ඩක් කෙට්ටු වෙන්න බලන්න.ගොඩාරියක් මහතයි නම් විතරයි හොදෙ..නැත්නම් චබි අය ලස්සනයි.ඔය 4ටොස් වල එහෙම බලන්නකො.චබියො ඉන්නෙ ලස්සනට.වෙඩින් එක දවසට ගොඩක් ලස්සනට ඉන්න කෙට්ටු වෙනව කියන මොටිවෙශන් එක හිතට අරන් තෙල් කෑම ,පැනිරස කෑම අඩු කරලා ව්‍යායාම කරලා කෙට්ටු වෙන්ටෝ...සිංහල වෙයිට් ලොස් ගුරු කියන ගෘෘ එකට ගිහින් එකෙ තියන එවා කරන්න.වියදම් නැතිව ලෙසියෙන්ම කරන්න පුලුවන් හාෆ් ප්ලේට් එක.එක කරන්න.
🐛හොදටම වතුර බොන්න
🐛සැලොන් එකෙ ෆෙශල් වලට යන්න.
🐛බ්ලිචිං තියන මොකුත් ගාන්න එපා.තාවකාලික සුදයි,ලෙඩ ගොඩකුයි ලැබෙයි.
🐛ඉන්ජක්ශන් වලට යන්නත් එපා එක ගොඩාක් බයානකයි.
🐛ෆේශල් වලට සල්ලි නැති අය ගෙදර ස්භාවික ට්‍රීට්මන්ට් කරන්න.
🐛තිසු බියුටි පේජ්,ලේඩි ග්ලොව් බියුටි ටිප්ස් එ පේජ් 2 තියනව හොද ස්භාවික දේවල්.
💚💚💚අන්තිමට කියන්න තියෙන්නෙ ඔයා ලංකාවේ තියන හොදම හොටෙල් එකෙ වෙඩින් එක ගත්තත් එන මිනිස්සු කියන්නෙ අනේ කෑම හරි නෑ කියලා ..ඔයිට වැඩිය අරක හොදයි මේක හොදයි කියලා ..
ඔයා හොදම දේවල් තේරුවත් අනිවාර්යයෙන් ඒකෙ ඇදයක් එන අයට පේනවා ..
ඒ නිසා ලොකුවට හිතන් නැතිව අඩු වියදමකින් සල්ලි නාස්ති නොවී ලස්සනට වෙඩින් එක කර ගන්න බලන්න ...
මොකද සල්ලි ඉතිරිය මගින් ඔයාලගෙ අනාගතය ලස්සන කර ගන්න පුලුවන් නිසා .